# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1809/8 - 2013 මැයි මස 07 වැනි අඟහරුවාදා - 2013.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතු කොට ගෙන හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

රංබණ්ඩි කටුගහපිහිල්ලේගේ විමලරත්න නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන දඹලාදෙනියගේ අසංක ප්‍රියනාත් කරුණාරත්න මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි මුදියන්සේලාගේ කුමුදු සමන් ශ්‍රී රත්නායක වන මම, දඹලාදෙනියගේ අසංක ප්‍රියනාත් කරුණාරත්න මහතා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සමන් ශ්‍රී රත්නායක,
තේරීම්භාර නිලධාරි,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 02 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මහනුවර.

05 - 561


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 17607— 350 (2013/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*